**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.03.24 පැය 0920 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 565/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**2025 පළාත් පාලන මැතිවරණ නීති උල්ලංඝණය කිරීම සහ ප්‍රචණ්ඩ ක්‍රියා වාර්තා වීම සම්බන්ධව.**

2025 පළාත් පාලන මැතිවරණයට අදාළව මැතිවරණ නීති උල්ලංඝණය කිරීම් සහ ප්‍රචණ්ඩ ක්‍රියා වාර්තා වීම සම්බන්ධව දිවයින පුරා පොලිස් ස්ථාන වෙත වාර්තා වූ පැමිණිලි සම්බන්ධව තොරතුරු පහත පරිදි වේ.

**2025.03.23 වන දිනට මැතිවරණයට අදාල අපරාධමය පැමිණිලි වාර්තා වී නැත.**

**2025.03.23 වන දිනට මැතිවරණ නීති උල්ලංඝණය කිරීම වලට අදාළ පැමිණිලි 06 ක් වාර්තා වී ඇත.**

- 2025.03.23 වන දින මාතලේ පොලිස් කොට්ඨාසයේ මාතලේ පොලිස් වසමේ මාතලේ දඹුල්ල මාර්ගයේ අළුවිහාරේ සිට පලාපත්වල මංසන්ධිය දක්වා මාර්ගයන්හි අපේක්ෂකයින්ගේ රුව සහිත පෝස්ටර් ඇලවීම සම්බන්ධව පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ලැබී ඇති අතර මාතලේ පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

- 2025.03.23 වන දින මාතලේ පොලිස් කොට්ඨාසයේ රත්තොට පොලිස් වසමේ මාතලේ රත්තොට මාර්ගයේ කයිකාවල සිට රත්තොට දක්වා ප්‍රදේශයේ දේශපාලන පක්ෂ ප්‍රවර්ධන වන ආකාරයේ කොඩි ප්‍රදර්ශනය කිරීම සම්බන්ධව පොලිස් ස්ථානයට පැමිණිලි ලැබී ඇති අතර රත්තොට පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

- 2025.03.23 වන දින මාතලේ පොලිස් කොට්ඨාසයේ රත්තොට පොලිස් වසමේ රත්තොට පොලිස් බල ප්‍රදේශයේ අපේක්ෂකයින්ගේ රුව සහිත බැනර් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධව පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ලැබී ඇති අතර රත්තොට පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

- 2025.03.23 වන දින කැබිතිගොල්ලෑව පොලිස් කොට්ඨාසයේ මැදවච්චිය පොලිස් වසමේ වියළි ආහාර බෙදා දීමක් සම්බන්ධව පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ලැබී ඇති අතර මැදවච්චිය පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

- 2025.03.23 වන දින පොළොන්නරුව පොලිස් කොට්ඨාසයේ පොළොන්නරුව පොලිස් වසමේ අපේක්ෂකයෙකු විසින් ප්‍රධාන මාර්ගයේ වීදි ලාම්පු අලුතින් සවි කිරීම සම්බන්ධව පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ලැබී ඇති අතර පොළොන්නරුව පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

- 2025.03.23 වන දින මොනරාගල පොලිස් කොට්ඨාසයේ මොනරාගල පොලිස් වසමේ විහාර මාවත, මොනරාගල මාර්ගයේ අපේක්ෂකයෙකුගේ රුව සහිත බැනර් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධව පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ලැබී ඇති අතර මොනරාගල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**